# බළන්ගොඩ නගර සභාව

## 2022-09-13 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.09.13**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ජී. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ජී. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිලධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-08-09 දිනැති මහා සභා වාර්තාව හා 2022-08-19 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-08-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-08-19 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, 2022-08-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-08-19 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-08-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-08-19 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පෙ.ව 10:09 ට සභාවට පැමිණෙන ලදී.**
**ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පෙ.ව 10:10 ට සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා නිවේදන වාරය ආරම්භ කරමින් පසුගිය වර්ෂයේ ක්‍රීඩා පිටිය කුලියට ලබා දීමෙන් රු.51,400.00 ක ආදායමක් ලැබුණ නමුත් මෙම වසරේ තමන් සභාපති වශයෙන් පත් වූ දා සිට මේ වන තෙක් ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් රු. ලක්ෂ 10 කට අධික මුදලක් උපයා ඇති බව පවසන ලදී.

- පසුගිය දින කෝවිලෙහි පූජාවක් සඳහා ගෙන ආ ඇත් පැටියෙක් අනවසරයෙන් ක්‍රීඩා පිටිය තුලට ඇතුල් කර තිබූ අතර, ඒ සම්බන්ධව දේශපාලන නායකයන් ඇතුළු ඉහළ නිලධාරීන් තමන්ට දුරකතනයෙන් අමතා ඇත් පැටියා නිදහස් කරන ලෙස පැවසූ බව ද සභාපතිවරයා වශයෙන් අවශ්‍ය නීතිමය කටයුතු තමන් විසින් සිදු කළ අතර, ක්‍රීඩා පිටියට හානියක් සිදු වී නොමැති බව ද දේශපාලන වශයෙන් මඩ ගැසීම් සිදු කරන නමුත් අනවසරයෙන් සිදු කළ කාර්යයක් බැවින් රු.10,000.00 ක හෝ දඩයක් ලබා ගෙන ඇත් පැටියා නිදහස් කිරීමට සූදානම් වූ බව ද පවසන ලදී.

නමුත් 156 වෙනි පොලිස් දිනය නිමිත්තෙන් බඩු මලු ප්‍රමාණයක් පෙට්ටිගල ප්‍රදේශයට බෙදා දීමට සූදානම් කර ඇති අතර, එයින් කිහිපයක් සෞඛ්‍ය කම්කරුවන්ට බෙදා දීමට හැකි බව පොලිස්පතිතුමා පැවසූ බව ද ඒ අනුව රු. 10,000.00 වෙනුවට එම වටිනාකමින් යුක්ත බඩු මලු 08 ක් වශයෙන් රු. 80,000.00 ක බඩු මලු සෞඛ්‍ය කම්කරුවන් වෙත ලබා දීමට හැකි වූ බව ද වැඩිදුරටත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පෙ.ව 10:15 ට සභාවට පැමිණෙන ලදී.**

- වරිපනම් බදු එකතු වීමේ දී විශාල පරතරයක් පැවති නමුත් තමන්ගේ මැදිහත් වීම මත විශාල මුදලක් සභාවට අය කර ගත් බවත්, ගරු නාගරික මන්ත්‍රීවරුන් ද උනන්දු වී සහයෝගය ලබා දුන් බවත් පවසන ලදී.

- ගලි බවුසර් සේවය ලබා දීම මගින් මෙම වසරේ ලැබූ ලාභය රු.ලක්ෂ 09 ඉක්මවා ඇති බවත්, ගරු මන්ත්‍රීවරුන්ගේ සහය ද ඇතිව සභාවේ ආදායම වැඩි කිරීම සඳහා තමා වගකීමෙන් කටයුතු කළ බවත් පැවසීය.

- පසුගිය දිනක පදික වෙළඳාම හා අනවසර වෙළඳාම ඉවත් කිරීමට කටයුතු කළ නමුත් පසුව එම වෙළෙන්ඳන් පත්ව ඇති ආර්ථික දුෂ්කරතාවය පිළිබඳව තමන්ට පැවසූ බව ද ගරු නාගරික මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා රට පත්ව ඇති ආර්ථික අර්බුදය සැලකිල්ලට ගෙන නීති ලිහිල් කර අවශ්‍ය අවස්ථාවන් ඔවුන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටිය බව ද පවසන ලදී.

- ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාපතිවරයා වශයෙන් සිටි කාලයේ දී මුදල් කමිටුවේ තීරණය මත කඩ කාමරයක් ලබා දී ඇති අතර, මුදල් කමිටු තීරණයකින් කඩ ලබා දිය නොහැකි බැවින් එය වැරදි තීන්දුවක් බව පැවසූ ගරු සභාපතිතුමා එම වාර්තා ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

- අසනීප තත්ත්වයන් හේතුවෙන් 2022-09-13 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- ආහාර සුරක්ෂිතතාව අරමුණු කර කෘෂි බෝග ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඇති බවත්, අක්කර 01 ක් පමණ වූ භූමි ප්‍රදේශයක විවිධ වූ බෝග වර්ග වගා කිරීමට අපේක්ෂා කරන අතර, ඊට අවශ්‍ය මූලික පොහොර සපයා ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවත්, කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑම් 500 ක් පමණ යෙදීමට සිදු වන බව කෘෂිකර්ම උපදේශක නිළධාරීන් නිර්දේශ කර ඇති බවත්, මෙම කරුණු සලකා බලා වගා ක්ෂේත්‍රයට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර

ප්‍රමාණය ලබා දෙන ලෙස බළන්ගොඩ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ප්‍රකාශ කළේ මෙය ඉතා හොඳ ව්‍යාපෘතියක් බැවින් සානුකම්පිතව බලා අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා දීම සුදුසු බවයි.

විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් ගරු සභාපතිතුමන් විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කොම්පෝස්ට් ප්‍රමාණය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

- තම නිවසට හා ජීවිතවලට හානි වන ආකාරයෙන් බළන්ගොඩ, හුණුකුඹුර ලිපිනයේ සුභාෂ් යන අය විසින් ඉදි කර ඇති උස් තාප්පයේ අත්තිවාරම ගැලවී කැඩී ඇති බැවින් මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය සහනයක් ලබා දෙන ලෙස පවසමින් බළන්ගොඩ, හුණුකුඹුර, දෙල්ගස්වත්ත, නො.333/2/1 ලිපිනයේ එස්.සෙල්වරාජා යන අය ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම පුද්ගලයා කිහිපවරක් මේ සම්බන්ධව අදාල අය වෙත දැනුම් දුන් නමුත් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැති බව ද ජීවිත හා දේපලවලට හානි සිදු විය හැකි බැවින් හැකි ඉක්මනින් තීරණයක් ගෙන මෙම තාප්පයේ අත්තිවාරම යෙදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද පවසන ලදී.

  ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ස්ථානීය පරීක්ෂාවක් කර වාර්තාවක් ලබා දෙන ලෙස වැඩ අධිකාරීතුමාට පැවසීය.

- බළන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ ඇල්ලෙපොල ගමේ පිහිටියා වූ අංක 620071 දරණ කැඩැස්තර සිතියමේ කලාප අංක 07 හි ලොට් අංක 101 දරණ මාර්ගය රජය සතු පොදු මාර්ගයක් වන අතර, මෙම මාර්ගයට යොදා තිබූ බෝක්කුව බළන්ගොඩ නාගරික මන්ත්‍රීවරියක විසින් කඩා දමා විනාශ කර ඇති බව ද මෙම බෝක්කුව නැවත සකස් කර දෙන ලෙසත් යොදා ඇති දූල් ආවරණය ඉවත් කර දෙන ලෙසත් ඉල්ලා බළන්ගොඩ,කරව්කැටිය වත්ත, අංක 37 ලිපිනයේ ජෝයි සිං රත්නම් දේවදාසන් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

  අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අදාල කැඩැස්තර සිතියම හා ස්ථානීය පරීක්ෂාවක් තමන් විසින් කළ අතර, ඒ අනුව මළදොළක් පවතින බව ද මනදොළ දෙපැත්තෙහි ඉඩම් කට්ටි කර විකුණා ඇති බව ද එම ඉඩම්වලට වෙන් වෙන් වශයෙන් පාරවල් පවතින නමුත් මළදොළින් එහාට පාරක් නොමැති බව ද

චන්ද්‍රසිරි යන අයගේ ඉඩම ආරම්භ වන ස්ථානයේ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ගේට්ටුවක් ගසා තිබුණු අතර, එය පසුව ඉවත් කළ බව ද පවසන ලදී.

- තමන් ජීවනෝපාය මාර්ගයක් වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ බළන්ගොඩ නගරයේ ලොතරැයි අලෙවි කල නමුත් තමා අසනීපව සිටි අවස්ථාවක දී එවක සිටි ගරු සභාපතිතුමා විසින් තමාගේ ලොතරැයි කුටිය නගර සභාවට රැගෙන ගොස් ඇති බවත් එය ලබා දෙන ලෙසත් ඉල්ලා බෙලිහුල්ඔය,හිල්මේ, සියඹලාගහ අසල ලිපිනයේ පී. නන්දසේන යන අය විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බුලත්ගම, ශ්‍රී සුනන්දාරාම මාවත ආරම්භයේ මාර්ගය අවහිර වන පරිදි අලුතින් ඉදි කර ඇති වැට මායිමක් නිසා රියදුරුන් අසීරුතාවයට පත්ව ඇති අතර, විදුලි පහන් කණුව අවහිර වී ඇති බවත්, මාර්ගය ආරම්භයේ නගර සභාව මඟින් ඉදි කර ඇති ගල් බැම්මට පස් දමා වසා දමා ඉනි වැටක් ඉදි කර ඇති බවත් මේ සම්බන්ධව සාධාරණයක් ඉටු කර දෙන ලෙසත් ඉල්ලා ශ්‍රී සුනන්දාරාම ගම්වැසියන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් කර කරුණු වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් වැඩ අධිකාරීතුමා වෙත පවසන ලදී.

- සුනන්දාරාම මාවත අවහිර වන පරිදි සීලා විමලසූරිය යන අය විසින් වැට මායිම් ගලවා කාණු පද්ධතිය අල්ලමින් අලුතින් වැට ඉදි කරන අයුරු නිරීක්ෂණය වන බැවින් මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස බුලත්ගම,සිරි සුනන්දාරාම මාවත, නො.264/19 ලිපිනයේ ගමගේ චරිත් ප්‍රියදර්ශන යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් කර කරුණු වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් වැඩ අධිකාරීතුමා වෙත පවසන ලදී.

- තම කඩ කාමරය පිහිටි පරිසරයෙහි මත් පැන් හා මත් ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ පාරදීසයක් වී ඇති අතර, ව්‍යාපාර කටයුතුවලට එය බාධාවක් වී ඇති බව ද දින කීපයකට පෙර නගර සභාව විසින් ඉදි කල වැට කඩා බිඳ දමා ඇති බව ද ඇවිදින මංතීරුව ඉදි කරන කාලය තුල තමාගේ කඩ කාමරයෙන් කොටසක් කඩා සහයෝගය ලබා දුන් බව ද අනවශ්‍ය පුද්ගලයින්ගේ ගැවසීම අඩු වීම සඳහා තම කඩ කාමරය පිටුපස කොටසෙහි තමාගේ වියදමින් යම් ඉදි කිරීමක් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා බළන්ගොඩ, බස්නැවතුම්පල, සී 57 ලිපිනයේ ඊ. තිලංග ප්‍රනාන්දු යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඇවිදින මංතීරුව මත්පැන් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් නිසා ජනතාවට පරිහරණය කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති අතර, එයට පිළියමක් මෙම ඉල්ලීම හරහා සැලසෙන බව ද සභාවේ පරමාර්ථය ඉෂ්ට වන්නේ නම් පමණක් අවස්ථාව ලබා දීම කළ හැකි අතර, ඒ සම්බන්ධව සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

මෙදින ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම් කිසිවක් නොමැති බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පෙ.ව 11:25 ට සභාවෙන් පිටවන ලදී.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

05:01:01 කර්මාන්ත කමිටුවල හා මහ සභාවල නිතර නිතර සම්මත කරන ලද නඩත්තු යෝජනා ක්‍රියාත්මක නොවන්නේ මන්ද? එයට හේතු දක්වන්න.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මාසයකට යෝජනා විශාල ප්‍රමාණයක් ලැබෙන බැවින් එම සියල්ලම ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කම්කරු පිරිසක් නැති බව ද යෝජනාවලට අමතරව හදිසි යෝජනා ක්‍රියාත්මක කිරීමට සිදු වීම නිසා යම් යම් ප්‍රමාදයන් සිදු වන බව ද පවසන ලදී. පසුගිය දිනක කුමාරගම ජනතාව වෙනුවෙන් බස් රථයක් ලබා දුන් නමුත් මාර්ගය අබලන් වීම නිසා ජනතාවගේ ඉල්ලීම මත මාර්ගය සකස් කර දුන් බව ද එවැනි හදිසි යෝජනා ක්‍රියාත්මක කිරීමට සිදු වන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුයේ එවැනි හදිසි යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව නොව තමන් 12 වතාවකට වැඩි වාර ගණනක් කර්මාන්ත කමිටුවට හා සභාවට කළ යෝජනා ඉටු නොකිරීම සම්බන්ධව මෙහි දී පිළිතුරක් අපේක්ෂා කළ බවයි.

**05:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

05:02:01 2022 වර්ෂය සඳහා මන්ත්‍රීවරුන්ට ලබා දුන් ලක්ෂ 10 ක මුදලින් කොපමණ මුදලක මන්ත්‍රීවරුන් වැඩ කරා ද යන්න ලිඛිතව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා | - | රු. 1,100,783.51 |
| ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා | - | රු. 1,087,976.90 |
| ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය | - | රු. 745,601.83 |
| ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය | - | රු. 318,500.00 |
| ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා | - | රු. 893,500.00 |
| ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා | - | රු. 100,000.00 |
| ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා | - | රු. 1,166,317.02 |

05:02:02 ඔබතුමා විසින් ගියවර සභාවේ දී නිවේදනය කෙරූ ආකාරයට පදික වෙළඳාම ඉවත් කර තිබේද? ඔව්.

**05:03 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

05:03:01 උඩකන්ද(කරව්කැටිය පාර) වතුර ගලා යන කාණුව සංවර්ධනය කිරීම පසුගිය සභා වාර 03 කදී කතා කළ නමුත් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. වර්තමාන තත්ත්වය කෙසේද?

අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සංවර්ධන කටයුතුවලට අදාල අමුද්‍රව්‍ය නොමැති වීම නිසා වැඩ ආරම්භ කිරීමට නොහැකිව ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

05:03:02 බස්නැවතුම්පළ ඇති කඩ කාමර 31 සඳහා ගිවිසුම් ගත වූ ආකාරයට ක්‍රියා කර ඇද්ද?කඩ දෙකක් විකුණා ඇති බවත් මාස ගාණක සිට වසා ඇති බවත් මේ සම්බන්ධයෙන් සභාව ගත් ක්‍රියාමාර්ගය කවරේ ද?

නව පදික කඩ කාමර 31 සඳහා නියමිත පරිදි කුලිය අය කරගන්නා අතර කඩ කුලී හිඟ නොමැති බවත්, වාර්ෂිකව ගිවිසුම් ගත වන අතර කඩ කාමර විකිණීමක් සම්බන්ධව වාර්තා වී නොමැති බවත්,මෙම කඩ කාමර දිනය පුරා විවෘතව නොතැබුව ද විවිධ ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කරන ආකාරය නිරීක්ෂණය වූ බැවින් දීර්ඝකාලීනව වසා තැබීමක් සිදු ව නොමැති බවටත් විෂය නිළධාරීන් වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුයේ එය බොරුවක් වන අතර, කඩ කාමර 04 ක් පමණක් විවෘතව ඇති බවයි. එබැවින් මේ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් වැරදි නීති ක්‍රියාත්මක වන බැවින් එම නීති නිවැරදි කරන ලෙසත් තමන් ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින බව වැඩිදුරටත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් හිඟ නොමැතිව කඩ කුලී අය වන නමුත් ගිවිසුම් ප්‍රකාරව දීර්ඝකාලයක් තිස්සේ වසා තැබිය නොහැකි බැවින් ඒ සම්බන්ධව වාර්තාවක් ලබා ගෙන ගිවිසුම් කඩ කර ඇත්නම් පවරා ගැනීමට කටයුතු කරන ලෙස ලේකම්තුමාට පවසන ලදී.

05:03:03 නිවාස ණයක් ලබා ගැනීමට අනුකුල සහතිකයක් ලබා ගැනීමේ සභාව ගෙන ඇති නීති ලිහිල් කිරීමට හැකියාවක් ඇති ද? ජනතාව අපහසුතාවයට පත්වෙන හෙයින් මේ සම්බන්ධයෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙමි.

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ වෙනම සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඉදි කිරීම් කටයුතුවලට අදාලව අනුමත ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතිකය ලබා දීම සම්බන්ධයෙන් පවතින නීති ලිහිල් කිරීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසිය යුතු බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 නඩු අංක 6442/ඉඩම සම්බන්ධ නඩුව සඳහා පිළිතුරු සකස් කිරීම වෙනුවෙන් රු.200,000.00 ක මුදලක් හා නඩු විභාගය සඳහා හෝ නීති තර්ක ඉදිරිපත් කිරීම සඳහා අධිකරණයේ පෙනී සිටීම

වෙනුවෙන් පෙනී සිටීමේ ගාස්තු ලෙස රු. 75,000.00 ක මුදලක් ජනාධිපති නීතිඥ ඩබ්.දයාරත්න මහතාට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය සම්බන්ධ නඩු අංක 6442 ඉඩම් නඩුවට අදාල පිළිතුරු 2022-10-26 දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස ගරු අධිකරණය මගින් දින ලබා දී ඇති බව ද මේ සඳහා ජනාධිපති නීතිඥ ඩබ්.දයාරත්න මහතාගේ නීතිඥ සහය ලබා ගැනීමට තීරණය කර ඇති බැවින් නඩුව සඳහා පිළිතුරු සකස් කිරීම වෙනුවෙන් රු.200,000.00 ක මුදලක් හා නඩු විභාගය සඳහා හෝ නීති තර්ක ඉදිරිපත් කිරීම සඳහා අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් පෙනී සිටීමේ ගාස්තු ලෙස රු. 75,000.00 ක මුදලක් ජනාධිපති නීතිඥ ඩබ්.දයාරත්න මහතාට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බළන්ගොඩ නගර සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය සතු ඇතැම් ඉඩම් කොටස් නගර සභාවේ ප්‍රයෝජනය සඳහා පවරා දී නගර සභාව සතු ඉඩම් කොටස් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට දෙපාර්ශවය අතර එකගතාවයකට එළඹී ඇත. එම ඉඩම් හුවමාරුවට අනුව රු.මිලියන 40ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට අය විය යුතුව ඇති බවත් එම මුදල ගෙවන ලෙසටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් හා වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ඇති වූ සාකච්ඡාවෙන් පසු රු.මිලියන 40ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් සභාව සතුව නොමැති බව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 රාස්සගල, දුරකන්ද, ර/බල/සමන්පුර සිද්ධාර්ථ විද්‍යාලයේ පවතින වැසිකිළි වලෙහි අපද්‍රව්‍ය ඉවත් කර දීම වෙනුවෙන් නොමිලේ ගලි සේවාව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ලිපියක් මඟින් මෙම විද්‍යාලය සඳහා ගලි සේවාව ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති නමුත් ඉන්ධන ඇතුළු වියදම් සැලකීමේ දී රු.22,000.00 ක පමණ මුදලක් වැය වන බව ද පාසලක් බැවින් නොමිලේ සේවාව ලබා දීම පිළිබඳව සභාව විසින් තීරණයක් ගන්නා ලෙස ද පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පැවසුයේ පාසල් ළමුන්ගේ සෞඛ්‍යාරක්ෂාව ගැන සලකා ගලි සේවාව ලබා දීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් සභාවේ පවතින මූල්‍ය තත්ත්වය අනුව ගලි සේවාව නොමිලේ ලබා දීම අපහසු බැවින් පාසල විසින් අනුග්‍රහයක් සොයා ගෙන ගලි සේවාව ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව මේ සම්බන්ධව ඇති වූ දීර්ඝ සාකච්ඡාවකින් පසු ර/බල/සමන්පුර සිද්ධාර්ථ විද්‍යාලයේ පවතින වැසිකිළි වලෙහි අපද්‍රව්‍ය ඉවත් කර දීම වෙනුවෙන් විශාල මුදලක් වැයවෙන බැවින් නොමිලේ සේවය සැපයීම අපහසු බව දන්වා බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සඳහා පිටපතක් සහිතව බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට ලිපියක් යොමු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ පොදු වැසිකිළි අබලන් තත්ත්වයක පවතින බැවින් සේවාලාභීන් හට පරිහරණය කිරීමට සුදුසු පරිදි අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා නව බදුලු මාර්ගයේ දොරවෙල ඔය ඉදිරිපිට ගල්වල අසල පිහිටි ඉඩම ලබා දෙන ලෙස බළන්ගොඩ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය විසින් ඉල්ලීමක් කර ඇති අතර, ඒ සම්බන්ධ සාකච්ඡා කර තීරණයක් ගැනීම සහ ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය විසින් 2022-06-06 වන දින සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයීය ගොඩනැගිල්ල තුල රෝගීන් සඳහා ඖෂධ නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති නමුත් රෝගීන් සංඛ්‍යාව වැඩි වීම හා ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන හෙයින් නව බඳුලු මාර්ගයේ දොරවෙල ගඟ ඉදිරිපිට ගල්වල අසල පිහිටි ඉඩම ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලා ඇති බව පවසන ලදී.

මෙම ඉඩම ලබා දීමට සභාවට අයිතියක් නොමැති බැවින් ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා නව බදුලු මාර්ගයේ දොරවෙල ඔය ඉදිරිපිට ගල්වල අසල පිහිටි ඉඩම ලබා දීමට නොහැකි බව සභාවේ මතය වූ බැවින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප විය.

06:01:07 බළන්ගොඩ නගර සභාවේ ආදායම් අංශයේ අංශ ප්‍රධාන වශයෙන් ඊ.එම්.නදීකා හර්ෂණී මිය වෙත බලතල පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2022 අප්‍රේල්, මැයි, හා ජූනි මාස වෙනුවෙන් රු. 36,530.91 ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය කුලියට ලබා දීමේ ගාස්තු වැඩි කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය කුලියට ලබා දීමේ ගාස්තුව මේ වන විට රු. 3,000.00 ක් වන අතර ක්‍රීඩා පිටිය ප්‍රේක්ෂකාගාරය සමඟ දිනකට ලබා දීමේ ගාස්තුව රු. 5,000.00 ක් වන බව ද වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම හේතුවෙන් එම ගාස්තු ඉහළ දැමීමේ අවශ්‍යතාවයක් පවතින බව ද පවසන ලදී.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා පිටියේ ගාස්තුව දිනකට රු.5,000.00 ක් හා ක්‍රීඩා පිටිය ප්‍රේක්ෂකාගාරය සමඟ දිනකට රු.8,000.00 ක් වශයෙන් සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 කාර්යසාධන ණය මුදලින් වැඩිපුර අය වී ඇති ණය වාරිකය වන රු. 6,636.00ක මුදල ආපසු ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි කොටසක රූපලාවන්‍ය ප්‍රතිකාර සිදු කිරීමට අවශ්‍ය කාමරයක් සකස් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි සේවය කරන ආයුර්වේද වෛද්‍යතුමිය නව්‍ය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන අතර, දේශීය ද්‍රව්‍ය උපයෝගී කර ගෙන රූපලාවන්‍ය ප්‍රතිකාර කිරීම සඳහා අපේක්ෂා කරගෙන ඇති බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 නව මහජන පොළ භූමියේ පවතින දොරවල් සවිකර නොමැති කඩ කාමර 16 නවීකරණය කර, රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත අය කිරීම් තීරණය කර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර බදු දීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ අංක ACLG 06/03/05 හා 2022-08-27 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව පොළ කඩ 16 සඳහා ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ප්‍රසම්පාදන කාර්ය පටිපාටියට පටහැනිව කටයුතු කළ නොහැකි අතර, මෙම කඩ කාමර 16 නවීකරණය කර,රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත අය කිරීම් තීරණය කර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර බදු දීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දැනුම් දී ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ආදායම් උත්පාදන යෝජනාවක් වශයෙන් තමන් 2019 දී මෙය යෝජනා කළ බවත්, මෙම කාර්යය සිදු කර ගෙන යාමේ දී තමන්ව සම්බන්ධ කරගන්නා ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 රථවාහන ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල වන රු. 202,259.84 ක මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් රථවාහන ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල රු. 592,986.25 ක් වන නමුත් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තැබීම නිසා එම හිඟ මුදල ගෙවීමට නොහැකි බවත් ඒ වෙනුවෙන් සහනයක් ලබා දෙන ලෙසත් අදාල ටෙන්ඩර්කරු ඉල්ලා ඇති බව පැවසීය.

ඒ අනුව 2021 අප්‍රේල් මස සිට නොවැම්බර් මස දක්වා කාලය තුල නගරයට පැමිණි රථවාහනවල පැහැදිලි අඩු වීමක් දක්නට ලැබුණු බව බළන්ගොඩ රථවාහන ස්ථානාධිපතිතුමාගේ වාර්තාව මඟින් පෙන්වා ඇති බැවින් එම වාර්තාවන් සැලකිල්ලට ගෙන එම කාල සීමාවට අදාලව ගාස්තු අය කිරීමේ දී සහන ලබා දුන් බව ද පවසන ලදී.

එමෙන්ම ධාවනය වූ රථ වාහන ප්‍රමාණය අනුව ගණනය කළ විට ටෙන්ඩර්කරු විසින් 2021 වර්ෂයට අදාලව ගෙවීමට ඇති මුදල රු.1,148,716.24 ක් වන නමුත් මේ වන විට ගෙවා ඇති මුදල රු. 946,456.40 ක් වන අතර, තවදුරටත් ගෙවීමට ඇති හිඟ මුදල රු. 202,259.84 ක් වන බව ද මෙම මුදල ගෙවීමට අදාල ටෙන්ඩර්කරු කැමැත්ත ප්‍රකාශ කර ඇති බව ද නීතිමය කටයුතුවලට යොමු වුවහොත් ඒ සඳහා දෙපාර්ශවයටම මූල්‍ය අලාභයක් සිදු වන බැවින් නීතිමය කටයුතුවලට නොගොස් මෙම හිඟ මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද ගරු සභාපතිතුමා වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රථවාහන ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල වන රු. 202,259.84 ක මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2021-01-01 දිනට නොපියවූ අත්තිකාරම් ගිණුමේ 2008 වර්ෂයට පෙර සිට පවතින ශේෂය වන රු. 8,462,769.84 ක ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය ලිපි ලේඛන නොමැතිවීම නිසා මෙම අත්තිකාරම් ගිණුමේ ශේෂය කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 බළන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන ඩබ්.ජී.වසන්ත ගුණරත්න වන මා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින බැවින් 2022 ඔක්තෝම්බර් 10 වන දින සිට 2023 ජනවාරි 10 දින දක්වා වූ මාස 03 ක කාලයක් සඳහා විදේශ නිවාඩු ලබා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 බළන්ගොඩ නගර සභා සීමාව තුළ මේ වන විට අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා වන අනවසර ගොඩනැගිලි සඳහා දඩ මුදලක් තීරණය කිරීම සහ කොන්දේසිවලට යටත්ව භාවිතයට ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-06-09 දිනැති මහ සභාවේ යෝජනා අංක 05:01:05 යටතේ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව අදාල අත්‍යවශ්‍ය කරුණු තෘප්ත නොකිරීම මත ප්‍රතික්ෂේප කරන ලද නමුත් බළන්ගොඩ නගර සභා සීමාව තුළ මේ වන විට අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා කරන අනවසර ගොඩනැගිලි කොන්දේසිවලට යටත්ව හෝ දඩ මුදලක් අය කර හෝ අනුමත කිරීම සුදුසු බවටත්, මෙම යෝජනාව නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඔවුන්ගේ උපදෙස් හා නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත් සභා සම්මත වූ බව පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ, තානායම් පාර, අංක 14 ලිපිනයේ එස්. උඩවත්ත යන අය හා බළන්ගොඩ, කෙළින් වීදිය, අංක 18 ලිපිනයේ අයි.එම්.සමීර් යන අය විසින් එම ලිපිනය සහිත ස්ථානවල ඉදි කර ඇති ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගොඩනැගිලි සැලසුම් 2022-08-03 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද ජංගම සේවය වෙත යොමු කළ බව ද එහි දී අදාල ගොඩනැගිලි වර්ෂ කිහිපයක් පැරණි බැවින් ඒ බව තහවුරු කර දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි සීමාව තුල ඉදි කර ඇති කොටස් සඳහා එම ආයතනයේ ලිඛිත නිර්දේශය ලබා ගැනීම කරන ලෙසත් දැන් වූ නමුත් එම ආයතනයේ නිර්දේශය ලබා ගැනීමට කල් ගත වන බැවින් සභාවේ සැලසුම් කමිටුවේ තීරණයන්ට පරිබාහිරව ව්‍යාපාරික හා මානුෂීය, පෞද්ගලික හේතූන් මත සානුකම්පිතව හා සද්භාවයෙන් තමාගේ අභිමතය පරිදි කොන්දේසිවලට යටත්ව අනුමැතිය ලබා දිය හැකි බව ද නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වන ලද දඩ මුදල විශාල මුදලක් බැවින් සභාවෙන් දඩ මුදලක් තීරණය කර අය කිරීම සුදුසු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ සභාවේ අනුමත නොවුණු ගොඩනැගිලි බොහෝ ප්‍රමාණයක් පවතින අතර, සභාපතිවරයාට තමාගේ අභිමතය පරිදි එම ස්ථාන අනුමත කිරීමට හැකි බවයි.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් මෙම ගොඩනැගිලි සභාවේ අනුමත වී නැති නමුත් ජල හා විදුලි සම්බන්ධතාවයන් ලබාගෙන නගර සභාවේ ගලි සේවය ඇතුලු සේවාවන් පවා ලබා ගන්නා බව ද වෙළඳ ව්‍යාපාරිකයන් සම්බන්ධව සිතා සාධාරණ මුදලක් අයකරගෙන අනුමත කිරීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අධික දඩ මුදලක් පනවන බැවින් සභාව විසින් සාධාරණ දඩයක් තීරණය කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා අදහස් දක්වමින් එක් නගර සභාවක මෙවැනිම වූ අඩු කිරීමක් සිදු කළ පසු සභාවේ මන්ත්‍රීවරුන්ට ගෙවීමට සිදු වූ බැවින් නීත්‍යානුකූලව කටයුතු සිදු කරන ලෙස ද දඩ මුදලක් අය කරගෙන අනුමැතිය ලබා දීමේ යෝජනාවට තමන් විරුද්ධ බව ද පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගර සභා සීමාව තුළ මේ වන විට අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා වන අනවසර ගොඩනැගිලි සඳහා දඩ මුදලක් අය කරගෙන අනුමැතිය ලබා දීම සඳහා විරුද්ධ වන බව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය, සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සහ කේ.ජී පේමදාස මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව එස්. උඩවත්ත හා අයි.එම්.සෆීර් යන අයගේ අදහස් විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල අදහස් පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව බළන්ගොඩ, තානායම් පාර, අංක 14 ලිපිනය සහිත ස්ථානයේ එස්. උඩවත්ත යන අය විසින් අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා වන අනවසර ගොඩනැගිල්ලෙහි මුළු වර්ග ප්‍රමාණයට සේවා ගාස්තුවක් ලෙස සාමාන්‍යයෙන් අය කළ යුතු මුදල වන රු. 788,460.00 ක මුදලින් 35% ක මුදල වන රු. 275,961.00 ක දඩ මුදලක් අය කර ගැනීමටත්, බළන්ගොඩ, කෙළින් වීදිය, අංක 18 ලිපිනයේ අයි.එම්.සෆීර් යන අය විසින් අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා වන අනවසර ගොඩනැගිල්ලෙහි මුළු වර්ග ප්‍රමාණයට සේවා ගාස්තුවක් ලෙස සාමාන්‍යයෙන් අය කළ යුතු මුදල වන රු. 575,080.00 ක මුදලින් 35% ක මුදල වන රු. 201,278.00 ක දඩ මුදලක් අය කර ගැනීමටත්, එම දෙදෙනා වෙතම අනුකූලතා සහතිකය ලබා දීමටත්, කොන්දේසිවලට යටත්ව අදාල පුද්ගලයන් එකඟ වන්නේ නම් පමණක් අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

කොන්දේසි -

- මෙම සාදා ඇති ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරී පනතේ පවතින අදාල නීති රීති තවදුරටත් බලපැවැත්වෙන අතර එම නීති රීතිවලට අනුකූල නොවන ලෙස සාදා ඇති ගොඩනැගිල්ලේ කොටස් හේතුවෙන් සිදු වී ඇති හා ඉදිරියේ දී සිදු විය හැකි යම්

කිසි කඩා වැටීමක්, ජීවිත හානියක්, ගින්නක්,අවහිරතාවයක් හෝ වෙනත් ආපදා තත්ත්වයක් සම්බන්ධයෙන් සිදුවන අලාභ හානි අනතුරු සඳහා වගකීම ඔබ විසින් දැරිය යුතුය.

- දැනට සාදා නිම කර ඇති කොටසට අමතරව කිසිදු අමතර ඉදි කිරීමක් සිදු නොකළ යුතුය.
- ඉදිරියේ දී සිදු විය හැකි මාර්ග පුළුල් කිරීමක් හෝ කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේ දී ගොඩනැගිලි සීමාව තුල පිහිටි කොටස් ඉවත් කිරීම ඔබ විසින් සිදු කළ යුතුය.
- මෙම ගොඩනැගිල්ල සම්බන්ධව සභාව විසින් පනවනු ලබන නීතිරීතින් හෝ දඩ මුදලකට හෝ යටත් විය යුතුය.
- ඉහත කොන්දේසිවලට එකඟ වන බව තහවුරු කරමින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ සම්මත විය.**

06:01:17 බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම හා අනුගමනය කළ යුතු ටෙන්ඩර් ක්‍රමවේදය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාවේ ටෙන්ඩර් කාලය 2022 නොවැම්බර් මස 30 වන දිනෙන් අවසන් වන අතර, 2022 දෙසැම්බර් මස 01 වන දින සිට 2023 නොවැම්බර් මස 30 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් නව බදුකරුවෙකු තෝරා ගැනීම සිදු කළ යුතුව ඇති බව ද ඒ සඳහා අනුගමනය කළ යුතු ටෙන්ඩර් ක්‍රමවේදය තීරණය කළ යුතු බව ද පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 බෝම්බුව හා ඕලුගංතොට සුසාන භූමියෙහි සේවය කරන ඩබ්.එල්.චන්ද්‍රසිරි තිලකරත්න යන අය හා අයි. ජයරාම් යන අය වෙත ගෙවනු ලබන දීමනා මුදල රු.15,000.00 දක්වා වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම දෙදෙනා අවුරුදු ගණනාවක් තිස්සේ බෝම්බුව හා ඕලුගංතොට සුසාන භූමියෙහි සේවයේ යෙදී සිටින අතර, රටේ පවතින දැඩි ආර්ථික තත්ත්වය හේතුවෙන් මසකට ලබා දෙන රු.10,000.00 ක දීමනාව ප්‍රමාණවත් නොවන බැවින් එම දීමනාව රු.15,000.00 දක්වා වැඩි කර ඩබ්.එල්.චන්ද්‍රසිරි තිලකරත්න යන අය හා අයි. ජයරාම් යන අය වෙත

රු.15,000.00 බැගින් දීමනා ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 බළන්ගොඩ නගර සභාවේ සැලසුම් හා ඉදි කිරීම් අංශය සඳහා දෛනික පදනම මත ඒ.ඩබ්.ධම්මික නයනජිත් අමරදාස යන අයගේ සේවය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවේ සැලසුම් හා ඉදි කිරීම් අංශයේ වැඩ පරිපාලක ලෙස සේවය කළ හැරල්ඩ් විජිත යන අය විශ්‍රාම යාම හේතුවෙන් එහි වැඩ ආවරණය කිරීම සඳහා ඒ.ඩබ්.ධම්මික නයනජිත් අමරදාස යන අයගේ සේවය ලබා ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද ඒ.ඩබ්.ධම්මික නයනජිත් අමරදාස යන අය වසර 05 ක් පමණ මාර්ග සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත් පදනම මත වැඩ සුපරීක්ෂක තනතුරෙහි සේවය කර ඇති බවද ජාතික තාක්ෂණික සහතික සිවිල් ඉංජිනේරු පාඨමාලාවක් හදාරා ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමේ ටෙන්ඩර් ගිවිසුම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 බළන්ගොඩ නගරයේ කැලි කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර් ගිවිසුම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:01:01 නගර සභා සීමාව තුල මෙතෙක් වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල වරිපනම් බදු එකතු කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සැකසීමට යෝජනා කිරීම

07:01:02 වාර්ෂික බලපත්‍ර (වෙළඳ) නිකුත් කිරීමේ දි සේවාලාභීන්ට සිදුවන අපහසුතා වළක්වා ගැනීම සඳහා සාකච්ඡා කර නිවැරදි වැඩපිළිවෙලක් සැකසීමට යෝජනා කිරීම

07:01:03 තුරු උයන භූමියේ සිදු කිරීමට යෝජිත නාගරික අවන්හල ඉදි කිරීම හා එහි සේවා සැපයිම,පවත්වාගෙන යාම සඳහා පුද්ගලික අංශයේ ආයෝජකයෙකු සමග ගිවිසුම්ගත වී හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට යෝජනා කිරීම

07:01:04 බස්නැවතුම්පළ ගොඩනැගිල්ලේ පාලන සහ නඩත්තු කටයුතු පිළිබඳ අවධානය යොමු කිරීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් නගර සභා සීමාව තුල මෙතෙක් වරිපනම් බදු අය නොකල ප්‍රදේශ පවතින නමුත් එම ප්‍රදේශ වෙත සේවාවන් ලබා දීම සිදු කරන බැවින් 2023 වර්ෂයේ සිට හෝ එම ප්‍රදේශයන් හඳුනාගෙන වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කරන ලෙස ද වාර්ෂික බලපත්‍ර (වෙළඳ) නිකුත් කිරීමේ දි ව්‍යාපාරය හඳුනා ගැනීම කළ යුතු අතර, එසේ නොමැති වුවහොත් අසාධාරණයන් සිදු වන බව ද වෙළඳ බලපත්‍ර ලබා ගැනීමේ දී අවශ්‍ය කරන ලිපි ලේඛන සම්බන්ධව හා කොන්දේසි පැහැදිලිව සඳහන් කර සේවාලාභීන්ට ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද පවසන ලදී.

එමෙන්ම නාගරික අවහන්හල බළන්ගොඩ නගරයට වැදගත් අංගයක් වන අතර, නාගරික සංවර්ධන අධිකාරිය සමග ගිවිසුම්ගත වීමෙන් ඉදිරියේ දී විවිධ ප්‍රශ්න ඇති වන බැවින් පුද්ගලික අංශයේ ආයෝජකයෙකු සමග ගිවිසුම්ගත වී හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමෙන් විශාල ආදායමක් සභාවට ලබා ගත හැකි බව ද බස්නැවතුම්පළ ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ මෝටර් සයිකල් ගමන් කරන අතර, කසළ එකතු නොකිරීම ඇතුළු ගැටලු රාශියක් පවතින බැවින් එහි පාලන සහ නඩත්තු කටයුතු පිළිබඳ අවධානය යොමු කරන ලෙස ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 **ගරු නාගරික මන්ත්‍රී එස්.ජී. ජෝර්ජ් මැතිතුමා**

07:02:01 බළන්ගොඩ නව නගරයේ බීමට ඇති ජල නලය පිළිසකර කර,පිංතාලියක් ලෙස ස්ථාපිත කර ජනයාට බීමට පහසුකම් සලසා දීම

07:02:02 බළන්ගොඩ මුස්ලිම් පල්ලිය ඉදිරිපිට අක්කර 18 යන පාර අවහිර වන සේ පැති බැම්මක් හා නිවාසයක් ඉදි කර ඇත. ඒ පිළිබඳව සුදුසු පියවරක් ගැනීම

07:02:03 බළන්ගොඩ ගොරොක්ගහමඩ කිරි මණ්ඩල ඉදිරිපිට ඇති දූණුගහමඩල පාර මා විසින් 2006 මහ සභා රැස්වීමේ දී එම්.එල්.එම්. අබුසාලි මාවත ලෙස නම් කරන මෙන් යෝජනා කළ අතර, එය සභාගත විය. එම වාර්තාව අවධානය පිණිස මතක් කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් දුණුගහමඩල පාර එම්.එල්.එම්.අබුසාලි මාවත ලෙස නම් කිරීමට අදාල කාර්යය එම කාල වකවානුවේ සිදු විය යුතු අතර මීට අවුරුදු 16 කට පෙර අනුමත වූවක් බැවින් ඒ සම්බන්ධව කරුණු සොයා බලන බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පැවසූයේ එම්.එල්.එම්.අබුසාලි මැතිතුමා කෙරෙහි විශාල ගෞරවයක් සිත් තුල පවතින නමුත් සිංහල ජනතාව බහුතරයක් වෙසෙන ප්‍රදේශයක මාර්ගයක් මුස්ලිම් නමකින් නම් කිරීම නිසා අර්බුදයක් ඇති විය හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පසුගිය වර්ෂයක තානායම් පිවිසුම් පාර එම්.එල්.එම්.අබුසාලි මාවත ලෙස නම් කිරීමට යෝජනා සම්මත වූ නමුත් පාස්කු ප්‍රහාරය සිදු වූ කාලයේ දී විශාල විරෝධයක් ඒ සඳහා යොමු වූ බව ද පසුව මාර්ග නම් කිරීමේ දී පොදු නමකින් මිස පෞද්ගලික නම් භාවිත නොකිරීමට යෝජනාවක් සම්මත වූ බව ද එම යෝජනාව නැවතත් වෙනස් කර පෞද්ගලික නම් යෙදීම සම්මත කර ගන්නා ලෙස ද බළන්ගොඩ ප්‍රදේශයට අවුරුදු 17 කට අධික කාලයක් විශාල සේවයක් කල මෙතුමාගේ නමින් තානායම් පිවිසුම් පාර නම් කිරීම සුදුසු බව ද බාන්ස් රත්වත්ත මාවත හා මොහාන් සාලිය එල්ලාවල මාවත මේ වන විට නම් කර ඇති බැවින් එයට එම්.එල්.එම්.අබුසාලි මාවත ද එක්වන්නේ නම් එය සුදුසු බව ද පැවසීය.

**07:02:01 හා 07:02:02 යෝජනා සඳහා විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

07:03:01 බළන්ගොඩ අලුත් පාරේ ජල ටැංකියේ අපතේ යන ජලය නල මාර්ගයෙන් බස් නැවතුම්පළට ගෙනත් ජනතාව වෙනුවෙන් පිරිසිදු ජලය පානයට යම් ස්ථානයක ටැංකියක් සවි කිරීම සඳහා කටයුතු කරන්න.

07:03:02 බස් නැවතුම්පළ ජෑම් ගස ඉදිරියේ ත්‍රිවිලර් නවතා තිබෙන ස්ථානයේ නගර සභාවට අයත් බිම් කොටසේ කඩ කිහිපයක් ඉදි කිරීමට හැකියාවක් ඇත. ඒ සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන්න.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් බළන්ගොඩ අලුත් පාරේ ජල ටැංකියේ අපතේ යන ජලය නල මාර්ගයෙන් බස් නැවතුම්පළට ගෙනවිත් ජනතාව වෙනුවෙන් පිරිසිදු ජලය පානයට යම් ස්ථානයක ටැංකියක් සවි කරන ලෙස ද බස් නැවතුම්පළ ජෑම් ගස ඉදිරියේ ත්‍රිවිලර් නවතා තිබෙන ස්ථානයේ නගර සභාවට අයත් බිම් කොටසේ කඩ කිහිපයක් ඉදි කිරීමට හැකියාවක් ඇති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කර සභාවට ආදායමක් ගැනීම සඳහා කඩ කිහිපයක් ඉදි කිරීමට කටයුතු කරන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

07:04:01 තම නිවසට යාබද ඉඩම සුද්ධ පවිත්‍ර කිරීම

07:04:02 නගර සභාවට පැමිණෙන මාර්ගයේ සමනල මුදලාලිට අයත් ඉඩම සුද්ධ පවිත්‍ර කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07:05:01 තානායම් පිවිසුම් මාර්ගය පටන් ගන්නා හංදියේ ඇත් වී ඇති කොන්ක්‍රීට් තහඩු ලංකර ක්‍රමවත්ව එම ස්ථානයේ අනතුරුදායක තත්ත්වය මඟ හැර දීම

07:05:02 තානායම් පිවිසුම් මාර්ගය පටන් ගන්නා හංදියේ ඇති One way දර්ශන පුවරුව රියදුරු මහතුන්ට හොඳාකාරව දර්ශණය වන ආකාරයට ක්‍රමවත්ව සවි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට උපදෙස් දීම

07:05:03 නගරයේ නොයෙකුත් තැන්වල පදික වේදිකාවේ කොන්ක්‍රීට් තහඩු කඩා වැටීමට ලක්ව ඇත.එම ස්ථාන නිසියාකාරව සාදා පදිකයින්ගේ අනතුරු වැළැක්වීමට කටයුතු කිරීම(බුහාරි හෝටලය,උසාවිය,ඩිෆරන්ට් ඉදිරිපිට) මෙම කොන්ක්‍රීට් තහඩු ගැන කොතරම් දැනුවත් කළත් මාර්ග සංවර්ධන අධිකාරිය නොසලකන බැවින් නගර සභාව මඟින් යම් පියවරක් ගැනීම

07:05:04 නගරයේ නව බස් නැවතුම්පළ,නව මහජන පොළ,මහජන ක්‍රීඩාංගනය, ලංකා බැංකුව, කොමර්ෂල් බැංකුව හා කඩ වීදිය යට වන ගංවතුර තත්ත්වය මඟහැරීමට නාගරික සංවර්ධන අධිකාරිය පොරොන්දු වූ ආකාරයට කටයුතු කිරීම හා ඊළඟ වර්ෂාව එනතෙක් බලා නොඉඳ නගර සභාවේ වගකීම හැකි ඉක්මනින් ඉටු කිරීමට උනන්දු වීම

07:05:05 ඇවිදින මංතීරුවට අද උද්ගත වී ඇති තත්ත්වය ඉතාම කණගාටුදායකයි.මත්පැන් සහ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නන්ගේ රජ දහනක් වී ඇති එම මංතීරුව ඇවිදීමට පාවිච්චි කරන්නන්ගේ ස්ථානයක් බවට පත් කිරීම සහ සවස් කාලයේ පොලිස් ජංගම සේවයක් ඉල්ලා සිටීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ඉහත යෝජනා ක්‍රියාත්මක කරන ලෙස ද නගරයේ නොයෙකුත් තැන්වල පදික වේදිකාවේ කොන්ක්‍රීට් තහඩු කඩා වැටීමට ලක්ව ඇති අතර, ඩිෆරන්ට් ආයතනය ඉදිරිපිට විශාල කපොල්ලක් පවතින බවට දැනුම් දුන් පසු පසුගිය දිනක ප්‍රිමික්ස් යොදා ඇති බව ද එම නිසා අනතුරුදායක බව වැඩි වී ඇති අතර, මාර්ග සංවර්ධන අධිකාරියෙන් සිදු කළ නමුත් නගර සභාවට දෝෂාරෝපණය එල්ල වන බව ද සීසී ටීවී කැමරා කිහිපයක් පැවති අතර, එම කැමරා සම්බන්ධව සොයා බලා නැවත ස්ථාපිත කරන්නේ නම් ගැටලු බොහොමයක් නිරාකරණය කර ගැනීමට හැකි වන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා පැවසූවේ 07:05:05 යෝජනාව ඉක්මනින් ක්‍රියාත්මක කිරීම කළ යුතු බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ, බස්නැවතුම්පළ සී 57 කඩ කාමරයෙහි ඊ.තිලංග ප්‍රනාන්දු යන අය විසින් පැමිණිලි හා සංදේශ යටතේ ඉදිරිපත් කර ඇති කාරණය ඉෂ්ට කිරීමෙන් මෙම සිද්ධිය වළක්වා ගැනීමට හැකියාව ලැබෙන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-09-09 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. 2022 අගෝස්තු මස කර්මාන්ත අංශය මඟින් සිදු කළ කර්මාන්තවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම

ii. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

- ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා - යෝජනා 08
- ගරු නාගරික මන්ත්‍රිනී අයි.ඒ.එම්. ඉලංකෝන් මැතිතුමිය - යෝජනා 02
- ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය - යෝජනා 03
- ගරු නාගරික මන්ත්‍රිනී එම්.සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය - යෝජනා 01
- ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා - යෝජනා 07
- ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා - යෝජනා 03
- ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා - යෝජනා 01
- ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා - යෝජනා 02
- ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා - යෝජනා 01
- ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා - යෝජනා 01

සැප්තැම්බර් මස කර්මාන්ත ඉටු කිරීම සඳහා දිනකට සේවකයන් 13 බැගින් දින 25 කට කම්කරුවන් 325ක් අවශ්‍ය වේ.

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන

ටිපර් රථය දින 25

ට්‍රැක්ටර් රථය දින 25

D/D රෝල දින 15

JCB යන්ත්‍රය පැය 50

iii. වෙනත් කරුණු

01. බස් නැවතුම්පල ස්ථානයේ ඇති වතුර ටැංකිය සඳහා පැවති වහලේ කැඩීගිය කොටස අලුත්වැඩියා කිරීම නිර්දේශ ලබා දීම

02. නව බස් නැවතුම්පල නව පදික කඩ කාමර ඉදිරිපස ත්‍රීවිල් රථගාලක් පවත්වාගන යන බව ගරු නාගරික මන්ත්‍රී විමලසිරි මැතිතුමා විසින් සඳහන් කළ අතර, එම රථගාල හැකි ඉක්මණින් ඉවත් කිරීමට පොලිසිය දැනුවත් කිරීමට නිර්දේශ ලබා දීම

03. ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමආරච්චි මැතිතුමා විසින් 2022.06.02.වන දින ළමා උද්‍යානයේ ගලවා ඉවත් කර දැනට ආයුර්වේද ගොඩනැගිල්ල ඉදිරිපස නිළ නිවස පරිශ්‍රයේ දමා ඇති ක්‍රීඩා භාණ්ඩ වැවවත්ත වතු නිවාස සුරැකුම් මධ්‍යස්ථානයේ සවි කිරීමට කළ යෝජනාව අනුමත වු නමුත් වැවවත්ත වතු අධිකාරිවරයාගේ දැඩි විරෝධතා මත එම ක්‍රීඩා උපකරණ සවි කිරීමට නොහැකි විය.එම නිසා එම ක්‍රීඩා උපකරණ ඇල්ලෙපොළ කැකුළු පෙර පාසල වෙත ලබාදිම වෙනුවෙන් නිර්දේශ ලබා දීම

08:02 **2022-08-24 දිනැති මුදල් කමිටු වාර්තාව**

1. PF - 4006 කැබ් රථය සඳහා 265 X 70 -16 ප්‍රමාණයේ ටයර් 04ක් ලබා ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම.
2. ZA 5039 JCB යන්ත්‍රයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම .
3. TaFe ට්‍රැක්ටර් රථවල සේවා කිරීම මීටර පැය 250 සම්පූර්ණ වු පසු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනිම
4. ගබඩාවේ අවසන්ව ඇති කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනීම
5. ඇස්තමේන්තු අනුමත කිරීම
    - කිවුලෙවෙල පන්සල මාර්ගයේ කඩාගෙන ගිය ස්ථානය පැති බැම්මක් මඟින් සංවර්ධනය කිරීම . රු.364,351.24

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-08-01 සිට 2022-08-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 11,845,436.31 |
| වෙනත් ලැබීම් | 2,478,518.93 |
| මුලු ලැබීම් | 14,323,955.24 |
| පුනරාවර්තන වියදම් | 7,095,459.74 |
| වෙනත් වියදම් | 4,539,098.39 |
| මුලු වියදම් | 11,634,558.13 |

2022-08-01 සිට 2022-08-30 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| RD-8000 | 34,400.00 |
| 56-1906 | 25,800.00 |
| 227-5020 | 153,330.00 |
| 37 -7933 | 29,800.00 |
| VI1833 | 1,800.00 |
| 226-7521 | 47,300.00 |
| BC-0005 | 51,600.00 |
| GC -0001 | 12,780.00 |
| LL - 7688 | 34,400.00 |
| CSM - 0009 | 1,800.00 |
| JD-4684 | 2,250.00 |
| ND-5124 | 103,200.00 |
| PF-4006 | 144,050.00 |
| QL-2901 | 12,150.00 |
| EP- 0002 | 19,350.00 |
| RC 1118 | 78,300.00 |
| GK 1483 | 77,400.00 |
| ZA 5039 | 8,600.00 |
| LL 2110 | 22,400.00 |
| SDRRY 0013 | 43,390.00 |
| SDRR 0013 | 2,150.00 |
| UQ1933 | 11,700.00 |
| ZA - 0228 | 10,750.00 |
| RE - 2600 | 94,600.00 |
| HF 7899 | 72,700.00 |
| OV/M 0017 43 | 860.00 |
| RC 8183 | 14,900.00 |
| RB 4786 | 83,850.00 |
| එකතුව | **1,195,610.00** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10:01 ගරු සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. වසන්ත ගුණරත්න මැතිතුමා**

**10:01:01** ප්‍රධාන බස් නැවතුම්පලෙහි පරවියන් ඇතුල්වීම වළක්වාලීම වෙනුවෙන් දැල් ආවරණ යෙදීම සඳහා වන ඇස්තමේන්තුව - රු.416,597.50

**10:01:02** බළන්ගොඩ පොදු බස් නැවතුම්පලෙහි පිරිමි වැසිකිළිය අලුත්වැඩියා කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු.2,756,653.06

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් කුමාරගම ප්‍රදේශයට බස් රථයක් ලබා දීම සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හා ගරු සභාපති, නාගරික මන්ත්‍රීන් හා නිළධාරීන් සියලු දෙනාට ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය දිනක ශ්‍රී ලංකා ක්‍රීඩික ක්‍රීඩිකාවන් ආසියානු කුසලතා ක්‍රිකට් තරඟාවලිය හා දැල් පන්දු තරඟාවලිය ජයග්‍රහණය කළ බව ද දින කිහිපයකට පෙර පැවති සංගීත ප්‍රසංගය උත්කර්ෂවත්ව පැවති බව ද අද දින ආයුධ පෙන්වීමක් සිදු වූ අතර, එය භයානක තත්ත්වයක් බැවින් ඒ සම්බන්ධව සලකා බලන ලෙස ද ගරු සභාපතිතුමාගේ විදෙස්ගත වීමට ආශිර්වාද කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක අවමංගල්‍යයකට පානීය ජල බවුසරයක් ඉල්ලූ අවස්ථාවේ දී මුදලෙන් කොටසක් පමණක් ලබා ගෙන ඉටු කරලීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ද එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 10 බැගින් සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන් කළ අතර එම කාලයේ රට ස්ථාවරව පැවති බව ද සභාවේ මන්ත්‍රීවරුන් සඳහා වෙන් වූ සභා මුදල් බැවින් හා මන්ත්‍රීවරුන් 17 දෙනාගේම යෝජනා එකවර ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත යම් ප්‍රමාදයන් සිදු වූ බව ද එම කාලය තුල රට අස්ථාවර වී වියදම් පාලනය කරන ලෙස දැනුම් දුන් බව ද තමන් ඇතුළු මන්ත්‍රීවරුන් ජනතාවට සේවය කිරීම සඳහා පැමිණි අතර, එම සේවය කිරීමට අවස්ථාව සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා බලහත්කාරයෙන් යම් යම් දේ ඉටු කර ගැනීමට උත්සාහ ගන්නා අතර, ආයුධ සභාවට ගෙනවිත් පෙන්වීම පිළිබඳව කණගාටුව පළ කරන බව ද කොට්ඨාස 10 වැඩ කටයුතු රැසක් පවතින අතර, එම කොට්ඨාස නිරීක්ෂණය කිරීම සිදු කරන ලෙස කර්මාන්ත කමිටු ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පසුගිය දිනක පදික වෙළඳාම ඉවත් කිරීමට ගරු සභාපතිතුමා කටයුතු කළ නමුත් සෙනසුරාදා ඉරිදා දිනයන්හි අවසර ලබා දී ඇති බවට ආරංචි වූ බව ද පදික වෙළඳාමේ නිරත බොහෝ දෙනෙක් සඳහා කඩ කාමර පවතින බැවින් මේ සඳහා ඉඩ ලබා නොදෙන ලෙස ද පසුගිය දිනක ක්‍රීඩාවෙන් ජයග්‍රහණය කළ ක්‍රිකට් කණ්ඩායම, ප්‍රවීනයන්ගේ ක්‍රිකට් කණ්ඩායම හා දැල්පන්දු ක්‍රීඩා කණ්ඩායම සඳහා සුභාශිංසනය එක් කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් තමන් අගෝස්තු කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ දුනුමඩලගහවත්ත මාර්ගය දෙපස සුද්ධ කිරීමට කම්කරුවන් දෙදෙනෙකු ලබා දීම ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් මන්ත්‍රීවරුන් සඳහා ලබා දුන් රු.ලක්ෂ 10 ක මුදලින් ලක්ෂ 05 ක් කුමාරගම ව්‍යාපෘතියක් සඳහා යෙද වූ බැවින් ඉතිරිව ඇත්තේ රු. ලක්ෂ 05 ක් පමණක් බව පැවසූ අතර, කොරෝනා වසංගතය හේතුවෙන් වරිපනම් සඳහා යම් අඩු වීමක් සිදු කළේදැයි විමසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මෙම සභාවට ගෞරවයක් දක්වන නමුත් අද දින පිහියක් පෙන්වමින් සිදු වූ  සිදුවීම කණගාටුදායක බව ද ගැහැණියක් වශයෙන් ඉදිරියට මෙම සභාවට පැමිණීමට බියක් ඇති වන අතර, සාධාරණය කතා කරන විට එදා සිටම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තමා සමඟ ගැටලු ඇති කර ගත් බව ද ඉඩම් ප්‍රශ්නයක් මුල් කරගෙන මෙම වෛරය තමා සමඟ ඇති කරගෙන ඇති බව ද වැඩිහිටියෙක් වශයෙන් එතුමාට ගරු කරන නමුත් සභාවට කළ නොහැකි යෝජනා නිරන්තරයෙන් ඉදිරිපත් කරන බව ද පවසන ලදී.

එමෙන්ම ක්‍රීඩා පිටියට අලියෙක් අනවසරයෙන් ඇතුලු කිරීම සිද්ධියේ දී ගරු සභාපතිතුමා සාධාරණව කටයුතු කළ අතර, එම අලියා හිටපු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බව ද නැවතත් හොරකම් කිරීමට බලයට පැමිණීමට සූදානම් වන බව ද කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු සංඛ්‍යාව නැවතත් වැඩි වී ඇති අතර එම වියදම සාමාන්‍ය ජනතාවට දැරීමට සිදු ව ඇති බවද අසික්කිත දේශපාලනයක් පවතින බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය තවදුරටත් අදහස් දක්වමින් පදික වෙළඳාම ඉවත් කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා පත් වූ තත්ත්වය ගැන ඉහළ නායකයන් සිතිය යුතු අතර, නොයෙකුත් ව්‍යාපාරයන් සිදු වන බව ද කොට්ඨාස මට්ටමින් අධීක්ෂණය කර වරිපනම් අය කර ගැනීම සිදු කිරීමෙන් විශාල මුදලක් අය කර ගත හැකි බව ද බළන්ගොඩ බස්නැවතුම්පලෙහි අනතුරුදායකව පවතින ස්ථානයට තහඩුවක් යොදන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් අද දින සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් කණගාටුවට පත්වන අතර, බලය ලබා ගත්තේ ජනතාවට සේවය කිරීමට බව ද මසකට වරක් රැස්වන මහ සභාවේ දී අනවශ්‍ය දේ ඉවත් කර අවශ්‍ය දේ කතා කිරීම සුදුසු බව ද ගරු සභාපතිතුමාගේ කැපවීම නිසා සභාවට ලැබෙන ආදායම වැඩි වී ඇති අතර, අත්‍යවශ්‍ය කර්මාන්ත හඳුනා ගෙන ඉටු කර ලීම සඳහා කොට්ඨාස මට්ටමින් අධීක්ෂණයක් සිදු කරන ලෙස කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමා වෙත යෝජනා

කරන බව ද සෞඛ්‍ය කමිටුවේ සාකච්ඡා වූ කරුණු කිහිපයක් ඉටු කර ගැනීම සඳහා වැඩ අධිකාරීතුමාගේ අවධානය යොමු කරන ලෙස ද පැවසීය.

එමෙන්ම රත්නසිරි නැමැති අයගේ වැසිකිළි වලට කොන්ක්‍රීට් ලෑලි යොදා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වූ අතර,ඔහු දියවැඩියා රෝගියෙක් බැවින් අසරණභාවය සලකා සභාපති අරමුදලින් හෝ එය ඉටු කර දෙන ලෙස ද ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පසුගිය කාලය තුල තමන්ව දැඩි දෝෂාරෝපණයකට ලක් කළ බව ද ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා විසින් අද දින පිහියක් රැගෙන පැමිණීම සම්බන්ධව කණගාටුවට පත් වන අතර, සභාවට පැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ව පරීක්ෂා කර ඔවුන් අපහසුතාවයට පත් කිරීම සුදුසු නොවන බව ද එතුමා අසනීප තත්ත්වයෙන් පසු වන අතර නැවත මෙවැනි සිදු වීමක් සිදු නොවීමට වග බලා ගන්නා බව ද තමන් නිවස ගිනි තැබූ සැකකරුවන් සමඟ පවා සුහදශීලීව කටයුතු කරන පුද්ගලයෙක් බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා හට වෙන්කල මුදලින් කර්මාන්ත කර ගැනීමට නොහැකි වූ බව පැවසූ නමුත් තමන් එය ඉටු කරදීමට උපරිම උත්සාහය ගත් බව ද ඒ සඳහා උනන්දුවක් තිබුණේ නම් එය ඉටු කර ගැනීමට හැකියාව තිබූ බව ද කේ.ජී. පේමදාස මැතිතුමා විසින් කම්කරුවන් දෙදෙනෙක් ඉල්ලූ අතර එය ලබා දීමට හැකි බව ද පැවසීය.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විසින් කරන ලද ඉල්ලීම් සලකා සෙනසුරාදා හා ඉරිදා දින පමණක් පදික වෙළඳාමට ඉඩ දුන් බව ද මාර්ග නම් කිරීමේ දී පොදුවේ නමක් යොදන්නේ නම් එයට තමන් කැමති බව ද පක්ෂ භේදයකින් තොරව සංහිඳියාවෙන් කටයුතු කිරීම සුදුසු බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.55 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.